# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 49 — 1973 මාර්තු 02 වැනි සිකුරාදා — 1973.03.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| පනත් කෙටුම් පත් ... | — |
| ශ්‍රී ලංකා ඇපල් මහාධිකරණයේ දැන්වීම ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම ... | 35 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 35 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 36 |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම ... ... ... ... | — |


සැළකිය යුතුයි.—මැණික් (කමා කිරීමේ) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම්

අංකය : ම. උ. පා. 17/71.

පානදුර මහේස්ත්‍රාත් උසාවිය

පරණ නඩු පොත් විනාශ කිරීම

පහත උපලේඛනයේ සඳහන් කර ඇති පානදුර මහේස්ත්‍රාත් උසාවියේ නඩු පොත් අද දින සිට මාස තුනකින් පසු ප්‍රඥප්ති නීති සංග්‍රහයේ (1956) ප්‍රතිශෝධිත සංස්කරණයේ 479 වැනි පරිච්ඡේදයේ විධිවිධානයන්ට යටත්ව විනාශ කරන බැව් මෙයින් දැනුම් දෙමි.

යම් නඩු පොතක් විනාශ නො කළ යුතු බවට උනන් දුවක් දක්වන කෙනෙක් වෙතොත් ඔහු විසින් පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු මගින් හෝ පෙත්සමක් මගින් හෝ කරුණු ඉදිරිපත් කළ යුතුය.

පු. බ. රඹුක්වැල්ල,
පානදුරේ මහේස්ත්‍රාත්.

1973 පෙබරවාරි මස 10 වෙනි දින,
පානදුර මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| 1954 | = | 20200—20399 |
| | | 22000—22199 |
| 1953 | = | 27900—32299 |
| | | 32400—37899 |
| 1955 | = | 37900—41799 |
| 1956 | = | 41800—43699 |

3-50—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### බස්නාහිර පළාත

කළුතර දිස්ත්‍රික් උසාවි නඩු ශාලාවේදීය

වඳුරබබේ පදිංචි වැගොඩ පතිරගේ පුංචි සිංඤෝ ..................
...................................................................... පැමිණිලිකාරයා.

නොම්මරය : පී 1955 එදිරිව

1. මුලටියන පදිංචි ඕවිටිගල විතානගේ පුංචි නෝනා සහ තවත්
අය ...................................................................... විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ පැමිණිලිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1973 ක්වූ අප්‍රේල් මස 2 වැනි දින පෙරවරු 10 ට ඉඩම් පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ඉඩම් වෙන්දේසි කරනු ලබන්නේ ඇස්කිසි ගාස්තු, පවුන්ඩේජ්, පිස්කල්, ගැසට් සහ ඉඩම් නහනම් කිරීමේ ගාස්තුද අයකර ගැනීම සඳහා ය.

උපලේඛනය

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දූන් කෝරළේ උතුරු මහ පත්තුවේ කිතුල්ගොඩ පිහිටා තිබෙන දොඩංගොඩයා කුඹුරට මායිම්: උතුරට හල්දොලයාකුඹුරද, නැගෙනහිරට මහා දෙනියද, දකුණට ඔත්තුකච්චිලියද්ද ද, බස්නාහිරට දෙපාවේල්ලද මායිම් තුළ වී 3න් පැලක වපසරිය ඇති ඉඩමෙන් නොබෙදූ 2/150 ක්ද,

2. ඉහත කී උතුරු මහ පත්තුවේ මුලටියන පිහිටි කිතුල්නාවලයා වත්තට මායිම්: උතුරට සහ බස්නාහිරට අකුල් ලියද්ද පිටකට්ටියද, නැගෙනහිරට ආණ්ඩුව සන්තක ඉඩමද, දකුණට කහටගහ වත්තේ කැලේද මායිම් තුළ අක්කර 3ක් විශාල ඉඩමෙන් නොබෙදූ 1/64 ක්ද,

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. ශමෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදව ලැබෙන දැන්වීම් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1970 ජූනි මස 2 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

35—බී 70817—5,544 (73/2)

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ කෙනෙකු විසින් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගෙවනු ලබන කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම ඇවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ට්ල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ලංකාවේ අණ පනත් යටතේ නිකුත් කළායයි පැවසෙන ප්‍රකාශන, ශ්‍රී ලංකාවේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළුවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| පෙබරවාරි | ... | 73.02.02 සිකුරාද | ... | 73.01.26 සිකුරාද | දවල් 12.00 |
| | | 73.02.09 සිකුරාද | ... | 73.02.02 සිකුරාද | දවල් 12.00 |
| | | 73.02.15 බ්‍රහස්පතින්ද | ... | 73.02.09 සිකුරාද | දවල් 12.00 |
| | | 73.02.23 සිකුරාද | ... | 73.02.15 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මාර්තු | | 73.03.02 සිකුරාද | ... | 73.02.23 සිකුරාද | දවල් 12.00 |
| | | 73.03.09 සිකුරාද | ... | 73.03.02 සිකුරාද | දවල් 12.00 |
| | | 73.03.16 සිකුරාද | ... | 73.03.09 සිකුරාද | දවල් 12.00 |
| | | 73.03.23 සිකුරාද | ... | 73.03.16 සිකුරාද | දවල් 12.00 |
| | | 73.03.30 සිකුරාද | ... | 73.03.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73.04.06 සිකුරාද | ... | 73.03.30 සිකුරාද | දවල් 12.00 |
| | | 73.04.11 බදාදා | ... | 73.04.06 සිකුරාද | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.